

# මේ වගේ මොහොතක...විජය

ඇස අද්දර මඳහස හා හුස්ම සොයන ජීවිතයකි
හිත අද්දර නිදහස පා පාද තබන ආදරයකි
අත අද්දර පත්තිරුවක කතා කරන ගොළු දෑසකි
ගඟ අද්දර ඔබ එනතුරු බලා හිඳින හිස් දහසකි

අසූ අටට ගිහින් එන්න * එතැන ඉන්න ආස ඈයො
ගල් ගැහුණත් වෙඩි වැදුණත් බදාගන්න කීව නෑයො
පාර දිගේ ජන යාගෙක හඬා වැටුණ රසික බෑයො
හිල් වී ගිය පපු අතරින් බඹරු ඇවිත්, සහෝදරයො

මධුසමයක් නොමැති තැනෙක වසන්තයක් කොහෙන් එයි ද
රැල්ලෙන් රැල්ලට නොගොසින් හිටිය එකම ඇති නෙමෙයි ද
ගව්වෙන් ගව්වට මාළිග මිසක් මිනිස්කම් රැකෙයි ද
විජය හිටිය නං රජයට දැනෙන රස්නෙ කොහොම වෙයි ද

පොඩිම කාලෙ උන්නු යාළු රැකගන්නට ලේ දන් දුන්
පොඩි මල්ලිට තිබ්බ හයිය ලොකු අයියල කෙරුවද සුන්
මිතු මළ දින උනපු කඳුළු අවිහිංසක සුසුමක හුන්
දඟගෙයි දඬුවම් විඳිද්දි ඔය හැටි කොහොමද සන්සුන්

අහස් ගව්ව කුලියට ගෙන පික්චර් තරු අලව අලව
රහස් කිව්ව පෙම්වතියනි, වෙනසක් නැත කළු ද සුදු ද
සහස් වසක් පසු කෙරුවත් ෆොටෝ * ඔටෝ සිඹින කුසුම
විජය මතක කෙල්ලන් හට මොකටද තව අඩුම කුඩුම

මිණි කිංකිණි හඬ පරදන ගැඹුරුම හඬ වෙන කාගෙද
පිනි සසැලෙන හිමිදිරියක යශෝදරා වෙන කාගෙද
ගිනි ගන්නා ජාතිවාද දුරැලූ දිය වෙන කාගෙද
තනි වූ විට පුතුට ලීව විමුක්ති ලිපි වෙන කාගෙද

සියපත සේ කළල් දියෙන් මතු වී ඉහළටම ආව
අසිපත විය රංගනයයි * ගායනයයි * බොක්ක පෑව
කැඩපත විසි වී ඡායා බිඳී යයි ද කවුරු ගාව
මොහොතකි, සැණෙකින් උපදින රුව යනු එය විජය රාව

සන්තානේ ලතාව දැන හදවතටම තට්ටු කෙරූ
හන්තානේ කතාවඬ ගෙන සඳවතකම සිහිල දැරූ
හැන්දෑවේ ෂෝ එක ළඟ ජීවිතයම නතර කෙරූ
සන්තානං මෑණියනේ ක්‍රිස්තු පුතා නොවෙද හිරූ

දෙයියෙක් වුණත් ගල් ගැහෙන්න ඇත්තෙ ඇත්තටම එදිනයි
අයියෙක් වුණත් මරදානේ වැටෙන්න ඇති ඉඩ එතැනයි
ලයියගෙ වුණත් දෑතින් දුවපු බුලට්ටෙකෙන් දුක නලියයි
වෛරෙක නොවන මහ සාමයක සමනල් දෑස් යුග නිදියයි

පෙමාතුර දුර තුෂාරාවෝ * සහෝදරයෝ නොදුටු බඹරා
දමා මුහුණත වැසුම් හැරගෙන කතා නොකළද සිතුම් අඹරා
අමා පැන් සේ අදත් සිහිකොට බලා අස්සන සඟව සමරා
සමා නැත, නෙත පමා ඇත මේ සදා ආදර සිහින කුමරා

කසුන් මහේන්ද්‍ර හීනටිගල




## තාත්තාගේ උපන්දිනය .....

ප්‍රනීත් කාරියවසම්

පියාණෙනි,
ඔබ සුවයෙන්
ඇතැයි සිතමි.....

ඔබගේ ඔවදන්
මතකයි තවමත්
දිවිමං අතරේ
ගමනක යෙදෙමින්
මමත්...

ඔබ අප වෙනුවෙන්
තැනූ ලෝකයම
තව තවත් පළල්ව
දකින්නට කරමි
වෑයම්

කුරිරුයි චණ්ඩයි
නොම සුළි සුළං
එහෙත්
සිතුවිලි, රූප
දිනපතා මුණගැසෙන

වෙහසක් දැනෙයි ඉඳහිට
ගත නොව සිත අඩපණ
කරන.....
දුරු රටක හිඳ  වුවත්
පතනෙමි ඔබට
නිරෝගී සුව........

## අම්මා

**විසිවස් සමර**

**සරත් වීරසේකර**

**- කැනඩාව**

විසි වසරකට පෙර මගෙ මව මල     දවස
සොහොණන් ලෙසින් නිසසල විය අප     නිවස
ගෙව්වත් පවුලෙ අය සුපුරුදු බාල     දවස
අම්මගෙ උඩුව මෙන් යිට සඳ නැති     අහස

විසි වසරක් තුලදි සිදු වූ දේ     බොහෝමයි
තුටු වූ දේ හීන, දුක් කඳුළැල්     බෝමයි
ඔබ කියූ පරිද්දෙන් එය අටලෝ     දහමයි
ෂැනසුම ලබන්නේ අපි හැම දෙන     එහෙමයි

පායා නොමැත අද රෑ සඳ     අම්බරයේ
දැනගෙන චන්ද තොරතුරු අප     අන්දරයේ
තවමත්දැවෙන හදවත දුන්     ගිසරයේ
තබනා වැනිය ගිනියම් ගත     පන්නරයේ

ගොක් කොළ පැලේ තෙල් පහනක් දැල්වෙනවා
මහි සඟරුවණ තුන් පිරිතට     සැරසෙනවා
කඳුලක් නයන කොණ ඇවිදින්     තෙරපෙනවා
ඉකියක් බිඳින්නට දෙතොළඟ වලි     කනවා

ඔබ මතු බවෙක අම්මේ ඔබ සොයා     එමී
ශිඳගෙන ඔබ ඇකැස, විස්තර අසා     ගමී
ඡලි කිසිදිනෙක ඔබ හැර ඈතක     නායමි.
ඔබෙ සෙනෙහසේ රැල්ලට මුවා     වෙමී

## ආවේගය

සරත් විජේසූරිය

වැඩහිඳි දුර්වර්ණ වූ සංස්කෘතික සදාචාරයන්
දිරාගිය ඇටසැකිලි සමාජීය කෞතුකාගාරයේ
අවදිවනු ! යදම් බිඳ
අතිශෝක්තියේ වීදුරුව බිඳලමින්
ඔපදමා විසිතුරු කරනු,
සරුව පිත්තල දනන්ගේ
සීනිබෝල චින්තනයන්

## නුඹ සිටින තැන කොතැන

රාජිකා හර්ශණී

වළා යහනත වෙලී
සඳ සමගලොව නිදන
අඳුරු රෑ මැදියමක....

ගලන කඳුලක දෙකක
ලියා මගෙ දුක සුසුම
හදාගමි හිත රිදෙන.......

මේ සඳම මෙතැන හිඳ
බැලු හැටි අප දෙදෙන
සිහිපත්ව පෙර එදින
අලුත් කඳුලක් උපන...
මතක වැල් නිම නොවන
නවතම්ද මම කොහොම.....?

බෝ දුරක ගිහින් නුඹ
ගෙදර එයි අද හවස
බොරු ගොතයි මගේ හිත
නුඹ සොයන හැම
මොහොත.....

නොතේරුණ හැම දෙයම
කියාදුන් විලස නුඹ
පහදන්නෙ කවුද මට
යළිත් නුඹ නේන වග.....

අප දෙදෙන එක් සිත්ව
සැදූ මල් කැකුළු පොඩි
පිපී හිනැහෙන අරුම
දකින්නට නුඹ නොමැත......

හදවතින් තුරුළු කර
නුඹ පැතුව හීන පැස
සැබෑවී ඇත මැණික
අඩුව නුඹ පමණි අද.....

කියා දුන් තාලයට
යොදා තුනපහ යසට
පිසින විට බත රසට
අපේ දරු පැටවුනට
දැනෙන්නෙම නුඹෙ සුවඳ
යනෙන හැමතැනම මට.....

පියා මෙන් විමි මවද
දුවගෙ ලස්සන දවස
නුඹ නමින් පිරිනැමූ
කිරි කව්චි ගෙන හිසට
හෙලු කඳුලක ගැඹුර
දන්නවා නම් සොඳුර........

සැකක් නැහැ නුඹ සිටින
තැන කියයි මට එන්න....

## පැරණි කවියක රස

රන්කිරි ගුණතිලක

### මාතර උසාවියේ එකල පනවා තිබුනේ යයි කියන නීතියක්

(මාතර පළාතේ විසූ සෙනෙවිරත්න මුදලිඳුගේ ප්‍රබන්ධයකැ යි ප්‍රකටය)

සපා නීති කටේ තිබුනත් බුලත් විඩ
එපා කෙලගැසුම ඉඳ සොල්දරේ උඩ
උපා කිසි නොදැන මෙම අන කලොත් කඩ
විපාකය ලැබෙයි රුපියල් පහක් දඩ

### වැලිතලප සෑදීම

(ඔදානිස් රබන් ගුරා ගේ ප්ර බන්ධයක්)

තකිරඟ කිරඟ කිරෙන්ද * දොම්කිට කිටි තක කුන්ද
කිටිතක තක්කිට කින්ද * ජෙනෙකිට ගුදිත ගුදන්

කැකුළු සහල් පිටියෙන්ද * වටකර ඕලූ ඇට මෙන්ද
තම්බා කඩ වැස්මෙන්ද * සුරැකිව තබා යෙහෙන්

එකිතුල් පැණි හකුරෙන්ද * මදක් සීනි සමගින්ද
සැදීගා කකාරමින්ද *ලනු වැටෙනා පදමින්

තිවග දෙදුරු සමගින්ද * එක එක පමණ යසි න්ද
බැද සුන් කර ගනිමින්ද *එකතුව සෑම දෙයින්

බඳුනක ලා සතොසින්ද * සමකර යස විලසින්ද
එදවස පසුව ගොසින්ද * * ගනිමින් පසුව තොසින්

කැබලිව සැතින් කපා ම * රඹකැන් සමග කදීම
ලොව සතහට සොඳ කෑම * අසනුය නැණැති සියල්

උදය උදය සැම දාම * වළඳා උනුපැන් බීම
සතසිත් වෙර පිනවාම * මියුරු දෙයකි සුවිපුල්

වැලිතලපය යන නාම * පැවසුය පෙරදුරු සෑම
වා පිත් සමන කිරීම * කදිමට වේ නිරවුල්.

***වත් පොතින් උපුටා ගන්නා ලද්දකි***

## පහන් නොවන රැය

ප්‍රේමවංශ දසනායක

අහස ගිගුරුවා ලූ
පොළොව දෙදරවා ලූ
සයුර දෙබෑකර ලූ
දැයට දිවි පුදා ලූ

ලෙයින් මසින් සැදුනු
හදවත පන ගැහුනු
මිනිස් ගුණය හැඳිනූ
දූ පුතුනුය ඔවුනූ

හඳක් තරුවක් නොමැති
අහස් ගැබ කලුවරය
විඩාවෙන් වැතිර ගත්
මහ පොළොව නිශ්චලය

අඳුරු කුලු සේ අවට
නිදි කිරන තුරු වදුල
හමන මඳ පවන වැද
සලිත වෙයි මොහොතකට

සා පිපාසෙන් පෙළෙන
රෑ කොබෙය්යකු නැගිට
තටු ගසා අතු පතර
ඉගිල යයි අඳුර මැද

ලඳු කැලය මැද තනිව
රැකවරණයක් නොලැබ
දිනෙන් දින රැයෙන් රැය
ගරා වැටෙනා ගෙපැල

ඉදිරි පස මල් පැලේ
බුදු රුවට පුද කෙරුණ
වතු සුද්ද මල් දෝත
පරව බිම විසිර ඇත

ගෙවී ගිය හෝරාව
අඳුර හා සටන් කළ
මල් පැලේ මැටි පහන
තෙල් සිඳී නිවී ඇත

හුදෙකලාවේ ගෙපැල
නිදි පැදුර මත වැතිර
නිදි නොලැබ රැය ගෙවන
විරු දරුව දිරිය මව

දැයට දිවි දුන් පුතුන්
සුසුම උණුසුම රැඳුන
උන් මතක සිහිවටන
හදවතට තුරුලු කොට

හෙට දිනක් නොපතනා
පහන් නොවනා රැයක
දිගුව යන හෝරාව
දෙස බලා සිටින්නිය

පෙර දිනය උන් නමින්
බෙර දවුල් හඬවමින්
පෙළහරින් වැඩම කළ
රජු ඇමති ප්‍රභූ කැළ

ඔවුන් සුවිසල් මැඳුර
බොමින් ජය පැන් බඳුන
පහන් නොවනා රැයක
සුව යහන සැතප ඇත

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com